සක්‍යා SAKYA ACADEMY OF HIGHER EDUCATION

learnonline by sakya

# ව්‍යාපාර අධ්‍යයනය
# 2021 SAP

## Online ව්‍යුහගත ප්‍රශ්න පත්‍රය සඳහා උපදෙස් පත්‍රිකාව

01. ප්‍රශ්න පත්‍රය ''I'' කොටස සහ ''II'' කොටස ලෙස කොටස් දෙකකින් යුක්ත වේ. ''I'' කොටසේ ප්‍රශ්න හතරක් ද, ''II'' කොටසේ ප්‍රශ්න හතරක් ද බැගින් මුළු ප්‍රශ්න අටකි.

02. පිළිතුරු සැපයීම සඳහා පැය **තුනයි මිනිත්තු දහයක** කාලයක් ලැබේ. **පළමු මිනිත්තු දහයක** කාලය තුළ ප්‍රශ්න පත්‍රය හොඳින් කියවා පිළිතුරු සපයන ප්‍රශ්න තෝරා ගන්න.

03. ''I'' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, ''II'' කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද ඇතුළුව මුළු ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

04. පිළිතුරු සැපයීම සඳහා A4 හෝ Foolscap ප්‍රමාණයේ කඩදාසි කොළ භාවිතා කරන්න. සෑම කොළයක ම හතර පැත්තෙන් ම අඟල් භාගයක මායිම ඉඩ (Margin) තබන්න.

05. පිළිතුරු පත්‍රයේ මුල් පිටුවේ පහත සඳහන් දෑ පමණක් ලියා තබන්න.

    (i) විභාගයේ නම
    උදා : 2021 SAP Final III

    (ii) ඔබේ සක්‍යා ශිෂ්‍ය හැඳුනුම්පත් අංකය
    (සක්‍යා ශිෂ්‍ය හැඳුනුම්පත් අංකයක් ලැබී නොමැති විභාග අපේක්ෂකයන් තම ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කරන්න.)

    (iii) පිළිතුරු ලියන ලද ප්‍රධාන ප්‍රශ්න අංක අනුපිළිවෙළින්
    උදා : 01, 02, 04, 06, 08

    (iv) පිළිතුරු සපයන ලද මුළු පිටු ගණන

06. පිළිතුරු පත්‍රයේ **සෑම පිටුවක** ම පිටු අංකය, සක්‍යා හැඳුනුම්පත් අංකය / ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදි ව සටහන් කරන්න.

07. සෑම **ප්‍රධාන** ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කරන්න.

08. පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා පැන්සල් භාවිතා නො කරන්න. පිළිතුරු පත්‍රය තුළ අනවශ්‍ය සටහන් ඇතුළත් නො කරන්න.

09. ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසානයේ දී පිළිතුරු පත්‍රයේ සම්පූර්ණ තොරතුරු පැහැදිලිව පෙනෙන පරිදි සෑම පිටුවක ම ඡායාරූප ගෙන ඔබට දී ඇති link එක වෙත upload කරන්න. සෑම පිටුවක් ම upload කිරීමට වගබලා ගන්න.

10. පිළිතුරු පත්‍රය upload කිරීම සඳහා පැය භාගයක කාලයක් හිමි වේ. තාක්ෂණික දෝෂ හේතුවෙන් එම කාලය තුළ upload කරගත නොහැකි වන විභාග අපේක්ෂකයින් ඔබට ලබා දෙන whatsapp අංකයට පිළිතුරු පත්‍රයේ ඡායාරූප එවන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

සක්යා උසස් අධ්‍යාපන ආයතනය
Sakya Academy of Higher Education

SAP EXAMINATION

සක්යා උසස් පෙළ පෙරහුරු විභාගය 2021
Sakya Advanced Level Preparatory Examination 2021

ව්‍යාපාර අධ්‍යයනය II
Business Studies II

32 S II

Final - 111

පැය තුනයි
*Three Hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස්**

* **I** කොටසින් ප්‍රශ්න දෙකක් ද, **II** කොටසින් ප්‍රශ්න දෙකක් ද ඇතුළු ව මුළු ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

(මෙම කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)

01. පරිසර කළමනාකරණය පිළිබඳ රුසියානු විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලත් මියුරු, රඹුක්කන ප්‍රදේශයේ තම පියාට අයත් පුවක් වත්තේ පුවක් ගස්වලින් වැටෙන කොළපත්වලින් කෑම ඇසුරුම් පෙට්ටි සැකසීමට තීරණය කළේ ය. තම මිතුරියක වන සරසි ද සමග පුවක් වත්තේ වැටෙන කොළපත් එකතු කර, ඒවා සෝදා පිරිසිදු කර, වේලා, පදම් කොට කෑම ඇසුරුම් පෙට්ටි සකස් කිරීමේ ව්‍යාපාරයක් "මියුරුසර නිෂ්පාදන" නමින් 2021 ඔක්තෝබර් 01 දින ආරම්භ කර අවශ්‍ය සේවකයින් බඳවා ගන්නා ලදි. මියුරු සහ සරසි රු. 60 000 බැගින් යොදා ව්‍යාපාරය ආරම්භ කළ අතර, එදිනම මියුරු සතුව තිබූ රුපියල් ලක්ෂ 5 ක් වටිනා ත්‍රී රෝද රථය ද ව්‍යාපාරයට යොදන ලදි. පසු දින අදාළ මුදලින් රුපියල් 25000 ක් යොදා කෑම පෙට්ටි අච්චු 50 ක් මිල දී ගන්නා ලදි. නිෂ්පාදනය කරන තම කෑම ඇසුරුම් පෙට්ටි හයිගිල්ස් සුපිරි වෙළෙඳ සැල් ජාලයට ණය පදනම මත බෙදාහැරීමට අපේක්ෂා කරයි. පොලිතීන් හා ප්ලාස්ටික් කෑම ඇසුරුම් පෙට්ටි තහනම් කිරීමට රජය ගත් තීරණය සමග "මියුරුසර නිෂ්පාදන" සඳහා ඉල්ලුම ඉහළ යමින් පවතී.

(i) (අ) "මියුරුසර නිෂ්පාදන" ව්‍යාපාරය සපුරාලනු ලබන මූලික මිනිස් අවශ්‍යතාව කුමක් ද ? ඔබ සඳහන් කළ මූලික මිනිස් අවශ්‍යතාව "මියුරුසර නිෂ්පාදන" ව්‍යාපාරය විසින් සපුරාලන ආකාරය සඳහන් කරන්න.

(ආ) "මියුරුසර නිෂ්පාදන" ව්‍යාපාරය විසින් නිෂ්පාදනය කරනු ලබන කෑම ඇසුරුම් පෙට්ටිවලට අදාළව පහත සඳහන් නිෂ්පාදන සාධක සඳහා නිදසුන් ලියන්න. (පිළිතුරු සැපයීමට පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න.) (ලකුණු 04 යි)

| නිෂ්පාදන සාධකය | නිදසුන |
|---|---|
| 1. භූමිය | |
| 2. ප්‍රාග්ධනය | |

(ii) (අ) මෙම සිද්ධියේ සඳහන්, ද. දේ. නිෂ්පාදිතයට එකතු කළ අගයක් ජනිත කරන ආර්ථික කටයුතු **දෙකක්** නම් කරන්න.

(ආ) "මියුරුසර නිෂ්පාදන" ව්‍යාපාරයේ **ශක්තියක්** සහ **අවස්ථාවක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) (අ) ඉහත සිද්ධියේ ඇතුළත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සඳහා නිදසුන් **දෙකක්** ලියන්න.

(ආ) මියුරු තම මිතුරිය වන සරසි සම්බන්ධ කර ගනිමින් ව්‍යාපාරයක් ඇරඹීමෙන් ඔහුට ලැබෙන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) වර්තමානයේ ව්‍යාපාර පරිසරය තුළ ව්‍යාපාරිකයන්ට විවිධාකාර අභියෝගයන්ට මුහුණ දීමට සිදුව ඇත. වර්තමානයේ ව්‍යාපාරිකයින් මුහුණ දෙන අභියෝග **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) කොවිඩ් 19 වෛරසයේ ව්‍යාප්තිය නිසා ප්‍රමිති ආයතනයේ අවශ්‍යතාවය ද අද තීව්‍ර වී ඇත. රටකට ප්‍රමිති ආයතනයක් අවශ්‍ය ඇයි ? (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ දෙවෙනි පිටුව බලන්න

02. (i) (අ) ''සමස්ත සමාජයේ සහ ප්‍රාදේශීය ජනතාවගේ, සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල, ජීවන තත්ත්වය නංවාලීමට සහ රටේ ආර්ථික සංවර්ධනයට දායක වන බවට මෙන් ම සදාචාරාත්මකව හැසිරෙන බවට ව්‍යාපාර අඛණ්ඩව කැපවීම සමාජ වගකීම ලෙස, තිරසර සංවර්ධනය පිළිබඳ ලෝක ව්‍යාපාර සභාව හඳුන්වයි.'' සේවකයින්ගේ මෙන් ම ඔවුන්ගේ පවුල්වල ජීවන තත්ත්වය නංවාලීමට ව්‍යාපාරයක් ඉටු කළ යුතු සමාජ වගකීම් කවරේදැයි දක්වන්න.

(ආ) දුම්රියක ගමන් කරන සුපිරි වෙළෙඳ සැලකින් භාණ්ඩ මිල දී ගන්නා අයෙකු විසින් පිළිපැදිය යුතු යැයි පොදුවේ පිළිගත් ආචාර ධර්ම **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(ii) මෑතක දී ආනයනික ඇතැම් පොල්තෙල්වල පිළිකා කාරක බැක්ටීරියාවක් වන ඇෆ්ලටොක්සින් (Aflatoxin) අඩංගු වී ඇති බව විද්‍යාත්මක පරීක්ෂණවලින් තහවුරු විය. පොල්තෙල් බෝතල් කර අලෙවි කරන ආයතනයක් එහි ලේබලයේ අනිවාර්යයෙන් දැක්විය යුතු තොරතුරු කවරේ ද ? (ලකුණු 04 යි)

(iii) "2020 වසරේ මෙරට ආර්ථික වර්ධනය සෘණ 3.6% ක අගයක් වාර්තා කළේ ය." මෙම අගය ධනාත්මක අගයක් බවට පත් කිරීමට ව්‍යාපාර ප්‍රජාවට දායක විය හැකි ආකාර **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) මෑත කාලයේ රජයේ ව්‍යාපාරවල ආයෝජනය කිරීමට විදේශ සමාගම්වලට රජය ආරාධනා කරයි. මෙලෙස විදේශ ආයෝජන හරහා රාජ්‍ය හා පෞද්ගලිකත්ව හවුල්කාර ක්‍රමයට (PPP) රජයේ ව්‍යාපාර සංවිධාන ස්වරූපය සකසා ගැනීමෙන් රජය බලාපොරොත්තු වන ප්‍රගතීන් **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) වරලත් ව්‍යාපාරයක් හා සම්බන්ධ පාර්ශ්ව දෙක නම් කර, එම එක් එක් පාර්ශ්වවල කාර්ය **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

03. (i) සීමාසහිත ග්‍රීන් ටෙක් (පෞද්) සමාගම නැනෝ යූරියා නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රමුඛ සමාගමකි. මෙම ආයතනය තවත් පුළුල් කරමින් සීමිත පොදු සමාගමක් බවට පත් කිරීමට යෝජනාවක් ඉදිරිපත් වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ දෙදෙනෙකු එම යෝජනාවේ ප්‍රතිලාභ පෙන්වා දෙමින් යෝජනාවට පක්ෂව කරුණු දැක්වූ අතර, තවත් අයෙකු යම් යම් සීමාවන් පෙන්වා දෙමින් යෝජනාවට විපක්ෂව කරුණු දැක් විය.

(අ) ඉහත සිද්ධියේ යෝජනාවට පක්ෂව අධ්‍යක්ෂවරයෙකු ලෙස ඔබ ඉදිරිපත් කරන ප්‍රතිලාභ මොනවා ද ?

(ආ) යෝජනාවට විපක්ෂව කරුණු පෙන්වා දුන් අධ්‍යක්ෂවරයා ඔබ නම් එසේ ඉදිරිපත් කරන සීමා මොනවා ද ? (ලකුණු 04 යි)

(ii) (අ) ව්‍යවසායකයෙකුට සමාජීය සුබසාධනය උදෙසා කළ හැකි කාර්යයන් **හතරක්** ලියන්න.

(ආ) ව්‍යවසායකයා හා ව්‍යාපාරිකයා අතර පවත්නා සමානකම් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) පහත සංවාදය විදේශයක සිට පැමිණි සම්පත් සහ රන්පත් යන ඥාතීන් දෙදෙනෙකු අතර සිදු වූවකි.

සම්පත් - මෙම කාඩ් පත ලබා දෙන විට ගිණුමක් තිබුණේ නැහැ. මුදල් හා භාණ්ඩ මිල දී ගන්නත් පුළුවන්. භාණ්ඩ ගත්තම දින කිහිපයක් යනතුරු පොලී අය කරන්නේ නැහැ.

රන්පත් - මගේ කාඩ් එකනම් හරිම සුරක්ෂිතයි. මුදල් ගන්නා විට පොලී ගන්නේ නැහැ. විටින් විට බැංකුවට මුදල් ගෙවා නැවත ආරෝපණය (Reload) කරගත හැක.

(අ) සම්පත් හා රන්පත් සතු ව පැවති ඉලෙක්ට්‍රොනික් මුදල් කාඩ් පත් වෙන වෙනම නම් කරන්න.

(ආ) සම්පත් හා රන්පත් සතු කාඩ් පත් භාවිත කිරීමෙන් ඔවුන්ට අත්විය හැකි අවාසි **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(iv) (අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවලට අමතරව ශ්‍රී ලංකාව තුළ මහජනයාගෙන් මුදල් තැන්පතු භාර ගැනීම සඳහා නීත්‍යානුකූල අවසර ඇති මූල්‍ය ආයතන වර්ග කවරේ ද ?

(ආ) **''ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතනයක්''** (Contractual Saving Institutions) යනු කුමක් දැයි නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) ලසන්ත තම රු. 500000 ක විශ්‍රාම පාරිතෝෂිකය ස්ථාවර තැන්පතුවක ද, තිළිණ තම රු. 500000 ක විශ්‍රාම පාරිතෝෂිකය කොළඹ කොටස් වෙළඳ පොළෙහි ද ආයෝජනය කරන ලදි. වසරක් අවසානයේ ලසන්තට රු. 40000 ක් ද, තිළිණට රු. 75000 ක් ද ප්‍රතිලාභ ලෙස හිමි විය.

(අ) ඉහත සිද්ධියේ ලසන්ත සහ තිළිණ ලද ප්‍රතිලාභ හඳුන්වන පද වෙන වෙන ම ලියන්න.

(ආ) සමාන මුදලක් සමාන කාලපරිච්ඡේදයක් සඳහා ආයෝජනය කළ ද ලසන්තට වඩා වැඩි ප්‍රතිලාභයක් තිළිණට ලැබීමට හේතුව කුමක් ද ? (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

04. (i) (අ) "ව්‍යාපාරවල පැවැත්ම සඳහා උපකාරක සේවාවක් ලෙස රක්‍ෂණය වැදගත් වේ." නිදසුන් දෙමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ආ) විශේෂ රැස්වීමක් නොවැම්බර් 10 වන දින ප.ව. 3 ට පාසලේ දී පවත්වන බව දන්වා විදුහල්පතිතුමා සියලු ම දෙමාපියන්ට ලිපි තැපැල් කරන ලදී.
ඉහත සිද්ධියේ සඳහන් වන, සන්නිවේදන මූලිකාංග **දෙකක්** ලියා, එම එක් එක් සන්නිවේදන මූලිකාංගය සඳහා නිදසුන බැගින් සිද්ධියෙන් උපුටා ලියන්න. (ලකුණු 04 යි)

(ii) කාර්යාල සේවා බස්රථ රියදුරෙකු වන ප්‍රේමතිලක සෑම දිනකම පෙ.ව. 5 ට මත්තලින් පිටත්ව අධිවේගී මාර්ගය ඔස්සේ පිටකොටුව මධ්‍යම බස් නැවතුම්පොළ දක්වා ගමන් කරයි. කොට්ටාව ඉන්ධන පිරවුම්හලින් අසොක් ලේලන්ඩ් බස් රථයට ඉන්ධන ලබා ගන්නා ප්‍රේමතිලක එදිනම ප. ව. 5 ට යළි මත්තල බලා පිටත් වේ. ප්‍රවාහන මූලිකාංග වන මාර්ගය, මාධ්‍ය, බලය සහ පර්යන්තය සඳහා නිදසුන් ඉහත සිද්ධිය ඇසුරෙන් වෙන වෙන ම ලියන්න. (ලකුණු 04 යි)

(iii) (අ) "ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සලකා බලන ප්‍රධාන සාධකයක් වනුයේ පිරිවැයයි." මෙම සාධකය යටතේ සලකා බලන මූලික පිරිවැය වර්ග **හතරක්** නම් කරන්න.

(ආ) "ගලපිටමඩ **මැට්‍රෝ ගෑස්** නමින් ගෘහස්ථ ගෑස් සිලින්ඩර් නිෂ්පාදන සමාගමක් ආරම්භ කිරීමට අදහස් කරයි." මෙම සමාගමට ප්‍රවාහන හා සැපයුම් සේවා විධිමත්ව සැලසුම් කිරීමෙන් ලබාගත හැකි ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) (අ) **වෙළෙඳ කලාපයක්** (Trade Block) සහ **ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුමක්** (Bilateral Trade Agreement) අතර වෙනස දක්වා, ශ්‍රී ලංකාව දැනට සාමාජිකත්වය දරන ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් සහ වෙළෙඳ කලාප **දෙක** බැගින් නම් කරන්න.

(ආ) වෙළෙඳ කලාපයක් හා සම්බන්ධ වීමෙන් සාමාජික රටකට අත්වන වාසි හා අවාසි පරීක්‍ෂා කරන්න. (ලකුණු 04 යි)

(v) සාම්ප්‍රදායික සිල්ලර වෙළෙඳ සැල් හිමියකු වන අංජන තම ව්‍යාපාරය ඉලෙක්ට්‍රොනික සිල්ලර වෙළෙඳ සැලක් බවට පරිවර්තනය කිරීමට අදහස් කරයි. එම තීරණය නිසා අංජනට අත්වන **වාසි** හා **අවාසි** ගැන ඔබ ඔහුට විස්තර කරන්නේ කෙසේ ද ? (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

## II කොටස

(මෙම කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)

05. (i) රාජ්‍ය ආයතන අසාර්ථකත්වයට ප්‍රධාන හේතුව කළමනාකරණයේ දුර්වලතා බව බොහෝ දෙනාගේ පිළිගැනීමයි. රාජ්‍ය ආයතනය සඳහා නිවැරදි කළමනාකරණයේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ආයතනයේ ප්‍රධානියා පිළිබඳව සේවකයෙකු ඉදිරිපත් කළ අදහසක් පහත දැක්වේ.
''අපේ ප්‍රධානියාට හරියට අපිව තේරුම් ගන්න බෑ. නිතර ම බලන්නේ අපි ගැන සැකෙන්. අපේ වෙහෙස මහන්සිය ඔහුට පෙනෙන්නේ නැති බවයි මගේ අදහස.''
ඉහත අදහස තුළින් පෙන්නුම් කරන්නේ නායකත්වයේ පවතින අඩු පාඩු පිළිබඳවයි.
සංවිධානයකට අසාර්ථක නායකත්වය තුළින් ඇතිවන අහිතකර තත්ත්වය පැහැදිලි කරන්න.

(ආ) ව්‍යාපාරයකට නිවැරදිව පරමාර්ථ ස්ථාපිත කිරීම අවශ්‍ය වන්නේ ඇයි ? (ලකුණු 04 යි)

(iii) ව්‍යාපාරයක ඉලක්ක ළඟා කර ගැනීමට සකස් කළ උපාය මාර්ග සමූහයක් සැලැස්ම තුළ අන්තර්ගත වේ. හොඳ සැලස්මක් තුළ පැවතිය යුතු මූලධර්ම **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) ආයතනයක සංවිධාන ව්‍යුහය පිළිබඳ මූලික තොරතුරු කිහිපයක් පහත දැක්වේ.
- GM, DGM, ඇතුළු ආංශික කළමනාකරුවන් හා සහකාර ආංශික කළමනාකරුවන් ලෙස බෙදී යන කළමනාකරණ මට්ටම් 4 කි.
- GM ගේ පාලන අවකාශය එකක් වන අතර අනෙක් කළමනාකරුවකුගේ පාලන අවකාශය 4 කි.
- ආයතනයේ සමස්ත කළමනාකරුවන් 22 දෙනෙකි.

ඉහත තොරතුරු භාවිත කර විධිමත් ව්‍යුහය පෙන්වීම සඳහා සිරස් සංවිධාන සටහනක් ඇඳ දක්වන්න. (ලකුණු 04 යි)

(v) බයිටෙක්ස් ඇඟලුම් කර්මාන්තශාලාවට තම ප්‍රදේශයේ අලුතින් නම් කළ ජාතික පාසලක නිවාසාන්තර මලල ක්‍රීඩා උළෙලේ සරඹ සංදර්ශනයට අදාළව නිවාස **හතරක්** සඳහා වර්ණ 4 කින් යුත් ඇඳුම් කට්ටල මැසීමේ ඇණවුමක් ලැබී ඇත.

(අ) මීට අදාළ නිෂ්පාදන ක්‍රමය කුමක් ද ?

(ආ) එම නිෂ්පාදන ක්‍රමයේ වාසි මොනවා ද ? (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ හතරවෙනි පිටුව බලන්න

06. (i) (අ) **මෙහෙයුම් පිරියත සැලැස්ම** (Operation Layout Plan) යනු කුමක් ද ?

(ආ) ''ගුවන් යානා'' සහ ''ටින් මාළු'' යන භාණ්ඩ වර්ග නිෂ්පාදනය කිරීමට වඩාත් යෝග්‍ය පිරියත ක්‍රම සඳහන් කර, ඊට හේතු දක්වන්න. (ලකුණු 04 යි)

(ii) **මහජන සම්බන්ධතා** යන්නෙන් අදහස් වන්නේ කුමක් දැයි පැහැදිලි කර, ඉන් ව්‍යාපාරයට අත්වන වාසි හා අවාසි **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) සීමිත XY සමාගමේ නිෂ්පාදිත මිශ්‍රය පහත දැක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| කේක් වර්ග | චොක්ලට් කේක් | බටර් කේක් | පෑට් කේක් | |
| අයිස් ක්‍රීම් | වැනිලා | පෑට් ඇන්ඩ් නට් | ස්ටොබෙරි | චොකලට් |
| බිස්කට් | මාරි බිස්කට් | වේෆර්ස් | නයිස් | ක්‍රීම් බිස්කට්<br>ලෙමන් ක්‍රීම් / චොකලට් ක්‍රීම් |
| විෂබීජ නාශක දියර | අත් සේදීම් දියර | නාන කාමර සේදීම් දියර | | |

(අ) ඉහත නිෂ්පාදිත මිශ්‍රයේ පළල, දිග, ගැඹුර සහ සංගතතාව දක්වන්න.

(ආ) මෙම සමාගමේ සංගතතාව වැඩිකර ගත හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ඉ) මෙම ආයතනයේ පළල වැඩිකර ගැනීමට යෝජනාවක් ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි)

(iv) මල්කි මනාලියන් හැඩගැන්වීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන්නී ය. මනාලියන්ගේ රුචි අරුචිකම් සලකා ඔවුන් ඉල්ලීම් කරන ආකාරයෙන් හැඩ ගැන්වීමට ඇය නිතර ම කටයුතු කරයි. ජීවිතයේ එක් අවස්ථාවක දී පමණක් හිමි වන මේ දිනයේ දී ඉහළ වටිනාකමක් මනාලියන්ට ලබා දීමෙන් ඔවුන්ගේ විශ්වාසය හා කැමැත්ත ලබා ගැනීමට ඇය අපේක්ෂා කරයි. මනාලියන් ලස්සනට හා ප්‍රියමනාපව හැඩ ගැන්වීමෙන් පාරිභෝගිකයන්ගේ තෘප්තිය ඉහළ නැංවීමට මෙන් ම ලාභයක් ලබා ගැනීමට ද ඇය බලාපොරොත්තු වේ.

(අ) මල්කිගේ අලෙවිකරණ දර්ශනය කුමක් ද ? එම දර්ශනය තුළින් ඇය ඉටුකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණ කුමක් දැයි නම් කරන්න.

(ආ) ඉහත ව්‍යාපාරය තම ව්‍යාපාරය සංවර්ධනය කර ගැනීම සඳහා ගෙන ඇති උපාය මාර්ගය දක්වන්න. (ලකුණු 04 යි)

(v) "රටක කොටස් වෙළඳ පොළ එරට ආර්ථිකයේ හැඩය පෙන්වන කැඩපතක් බඳු ය." (Stock market is a Mirror of Economy) මෙහි අර්ථය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

07. (i) සීමාසහිත මැක්සි සමාගමෙහි ගිණුම් පොත්වලින් උපුටා ගත් දත්ත සමූහයක් පහත දැක් වේ.

2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | රු. |
|---|---:|
| විකුණුම් | 1,000,000 |
| විකුණුම් පිරිවැය | 600,000 |
| දළ ලාභය | 400,000 |
| වියදම් | 100,000 |
| කාලච්ඡේදයේ ලාභය | 300,000 |

2021.03.31 දිනට ගිණුම් ශේෂ :

| | රු. |
|---|---:|
| ඉඩම් හා ගොඩනැගිලි | 2,500,000 |
| ලී බඩු හා සවි කිරීම් | 500,000 |
| භාණ්ඩ තොගය | 200,000 |
| ණයගැතියෝ | 150,000 |
| බැංකු ශේෂය | 50,000 |
| ණයහිමියෝ | 100,000 |
| 2020.04.01 දිනට භාණ්ඩ තොගය | 100,000 |

(අ) ඉහත දත්ත ඇසුරෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.
A. දළ ලාභ අනුපාතය
B. ශුද්ධ ලාභ අනුපාතය
C. ජංගම අනුපාතය
D. තොග පිරිවැටුම් අනුපාතය

(ආ) මැක්සි සමාගමෙහි පහත කරුණු පිළිබඳ ව පැහැදිලි කරන්න.
A. ද්‍රවශීලතාව
B. තොග පිරිවැටුම් ශීඝ්‍රතාව (ලකුණු 04 යි)

(ii) (අ) කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සේවකයින් කෙරෙහි ඇති කළ අහිතකර බලපෑම් කවරේදැයි පැහැදිලි කරන්න.
(ආ) යම් තනතුරක් සඳහා ඉහළ සුදුසුකම් සහිත හෝ ඌන සුදුසුකම් සහිත අයෙකු බඳවා ගැනීමෙන් ආයතනයකට ඇතිවන අහිතකර ප්‍රතිවිපාක කවරේ ද ? (ලකුණු 04 යි)

(iii) **සංවේතන කළමනාකරණය** (Pay management) යන්න පැහැදිලි කර, ආයතනයකට සංවේතන කළමනාකරණයේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)

(iv) ශ්‍රී ලංකාවේ යම් යම් ආයතනයන්හි සේවක දුක් ගැනවිලි ගැන නිතර අසන්නට ලැබේ. සේවක දුක් ගැනවිලි ඇති වීමට බලපෑ හැකි යැයි සිතිය හැකි පොදු හේතු **තුනක්** නම් කර, ඒවා නිවාරණයට මානව සම්පත් කළමනාකරු විසින් ගත යුතු ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) ගුරු, විදුහල්පති වැඩ වර්ජනය දින 90 ක් පසු කරමින් ක්‍රියාත්මක විය. වැඩවර්ජන වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයන් ගුරුවරුන්ට හා මෙරට ආර්ථිකයට සිදු කරන බලපෑම වෙන වෙන ම පැහැදිලි කරන්න.
(ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

08. (i) මෙවර උසස් පෙළ විභාගයට පෙනී සිටින ශිෂ්‍යයෙකු කොවිඩ් නිසා පාසල් කටයුතු අඩාල වීමෙන් අතපසු වූ පාඩම් කිහිපයක් පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා අන්තර්ජාල පහසුකම් සපයන ස්ථානයකට (Internet cafe) ගොස් වෙබ් අඩවිවලට පිවිස අවශ්‍ය තොරතුරු පිටපත් බාගත (Download) කර ගන්නා ලදී.
(අ) මෙහිදී භාවිත වූ දෘඩාංග හා මෘදුකාංග වෙන වෙන ම සඳහන් කරන්න.
(ආ) තොරතුරු පිටපත් කිරීමේ දී භාවිත කළ අන්තර්ජාල සේවාව හඳුන්වන්නේ කුමන නමකින් ද ?
(ලකුණු 04 යි)

(ii) Meta Platforms සමූහයට අයත් WhatsApp සන්නිවේදන ක්‍රමයෙන් ඔබ අත්විඳින වාසි හා අවාසි **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(iii) වෙන්දකඩුව වීර ගාමිණී විද්‍යාලයීය පුස්තකාලයෙහි පොත් රාශියක් තිබේ. සමහර පොත්වල පිටපත් කිහිපය බැගින් ඇත. සිසුන්ට සති දෙකක කාලයක් සඳහා වරකට පොත් **දෙක** බැගින් ලබා ගත හැකිය.
(අ) පොත් සම්බන්ධයෙන් පුස්තකාලයේ ගබඩා (Store) කළ යුතු දත්ත (Data) අයිතම **දෙකක්** සඳහන් කරන්න.
(ආ) හස්තමය (Manual) පුස්තකාල පද්ධතියක් සඳහා තොරතුරු කළමනාකරණ තාක්ෂණය (IMT) යොදා ගැනීමේ වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) විසල් දත්ත (Big Data) යන සංකල්පය හඳුන්වා එය ව්‍යාපාරයකට ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.
(ආ) ව්‍යාපාරිකයෙකුට ව්‍යාපාර සැලැස්මක් නොමැති වීමෙන් මුහුණ දීමට සිදුවන ගැටලු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) මැටිමාටින් ගඩොල් කපා විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. ඒ සඳහා ඔහු සකස් කළ යුතු ව්‍යාපාර සැලැස්මෙහි, අලෙවිකරණ සැලැස්මක ඇතුළත් විය යුතු කරුණු උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

***

සැකසුම ඃ බණ්ඩාර දිසානායක.
B.Sc.(Mgt) Sp.